**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම (සීමිත) – 2021(2023)**
**සේවාරම්භක පුහුණු වැඩසටහන - 2025**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන ශ්‍රේණිය සඳහා සීමිත තරඟ විභාගය අනුව, 2025.09.01 දින සිට  බඳවා ගනු ලබන නිලධාරින් 405ක් සඳහා එම සේවා ව්‍යවස්ථාව අනුව මාස තුනක සේවාරම්භක පුහුණු පාඨමාලාව 2025.09.02 දින සිට නේවාසික වැඩසටහනක් ලෙස ආරම්භ කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන ශාඛාව විසින් කටයුතු සංවිධානය කර ඇත.

සියලුම පත්වීම්ලාභීන් මෙම පුහුණු පාඨමාලාව සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

2025.09.01 දින අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පෙ.ව.10.00 ට ආරම්භ වන පත්වීම් ලිපි ප්‍රදානෝත්සවය අවසන් වීමෙන් අනතුරුව, සියලුම පත්වීම්ලාභීන් පුහුණු පාඨමාලාව පැවැත්වෙන පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කරනු ලැබේ. එදින සිට පුහුණු පාඨමාලාව ආරම්භ කරන බැවින් අමාත්‍යාංශයේ සිට පුහුණු මධ්‍යස්ථාන වෙත යාම සඳහා පත්වීම්ලාභීන්ට ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

**පුහුණු මධ්‍යස්ථානය වෙත රැගෙන ආ යුතු ලිපි ලේඛන/ ද්‍රව්‍ය**

1. ජාතික හැඳුනුම්පත
2. පෞද්ගලික පරිහරණය සඳහා අවශ්‍ය දෑ. (ඖෂධ, වෛද්‍ය වාර්තා, ඇඳ ඇතිරිලි හා කොට්ටා උර, සනීපාරක්ෂක ද්‍රව්‍ය ආදිය ද ඇතුළුව)
3. ඇඳුම
    I. නිලධාරිනියන් සඳහා සාරිය හෝ ඔසරිය
    II. නිලධාරීන් සඳහා - ටයි පටිය සහිත අත් දිග කමිස හා දිග කලිසම හෝ ජාතික ඇඳුම